සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **කතෝලික ධර්මය I** කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01 ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ එන නෙහෙමියා ග්‍රන්ථය,

(i) පංච පුස්තකයට අයත් පොතකි. (ii) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථයකි.

(iii) ඉතිහාස පොතකි. (iv) දිවැසිවර ග්‍රන්ථයකි.

02 පුරාණ ගිවිසුමේ අඩංගු ගැලවීමේ ඉතිහාසයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,

(i) ඓතිහාසික සිදුවීම් වාර්තා කිරීමයි.

(ii) දේව විශ්වාසය වර්ධනය කිරීමයි.

(iii) ඉශ්‍රායෙල් ජනතාවගේ ජීවිත හුවා දැක්වීමයි.

(iv) ජේසුස් වහන්සේගේ පෙරමඟ සැරසීමයි.

03 ශුද්ධවූ ලූක්තුමා සහභාගී වූයේ පාවුළුතුමාගේ කුමන ධර්මදූත චාරිකා වලටද?

(i) පළමු හා දෙවන (ii) පළමු හා තෙවන

(iii) දෙවන හා තෙවන (iv) පළමු, දෙවන හා තෙවන

04 අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්ම පිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.

A - ජුදයේ හා සමාරියේ සාක්ෂි දැරීම.

B - ධර්මදූත සේවයට සූදානම

C - ශුද්ධ වූ පාවුළුතුමාගේ ධර්මදූත සේවය

D - ජෙරුසලමෙහි සාක්ෂි දැරීම.

(i) A, B, C, D (ii) B, A, D, C (iii) A, C, B, D (iv) B, D, A, C

05 ශුද්ධවූ පාවුළුතුමාගේ ලිපිවලින් හෙළිවන ප්‍රධාන කරුණක් වන්නේ,

(i) එතුමාගේ ලේඛන හැකියාවේ අපූර්වත්වයයි.

(ii) එතුමා ක්‍රිස්තුස් වහන්සේ තුළ තැබූ අචල විශ්වාසයයි.

(iii) පාවුළුතුමා දක්ෂ වෛද්‍යවරයෙකු හා ඉතිහාසඥයෙකු බවයි.

(iv) පාවුළුතුමාගේ නායකත්වය හා සංඝ සමඟ පැවති සබැඳියාවයි.

06 කිතුනු සංඝයක් පෞද්ගලිකව හමුවිය නොහැකි අවස්ථාවල, ශුද්ධවූ පාවුළුතුමා එම සංඝවලට මඟ පෙන්වූයේ,

(i) සංඝයට නායකයෙකු පත් කිරීමෙනි. (ii) සංඝයට පොදුවේ ආමන්ත්‍රණය කිරීමෙනි.

(iii) වෙනත් පුද්ගලයෙකු යැවීමෙනි. (iv) ලිපි යැවීමෙනි.

07 කිතුනුවන් විශ්වාසය තුළ ස්ථිර කිරීම සඳහා පාවුළුතුමා සිරගතව සිටින විට ලියූ ලිපියකි.

(i) එපීස (ii) රෝම (iii) පිලිප්පි (iv) කොලොස්සි

08 සියළු නපුරු බලවේග විනාශ වී, ඇදහිලිවන්තයින් උදෙසා සෞභාග්‍යවත් කාලයක් උදාවන බව අගවන්නේ,

(i) ද්විත්වවාදයෙනි. (ii) යුගාන්තවාදයෙනි.

(iii) සංකේත භාවිතයෙනි. (iv) ආරූඪ නාමයන්කින් ඉදිරිපත් කිරීමෙනි.

09 එළිදරව් සාහිත්‍යය බිහිවුනේ,

(i) ඉශ්‍රායෙල් දිවැසිවරුන් ක්‍රමයෙන් අතුරුදහන් වන යුගයක ය.

(ii) ඉශ්‍රායෙල් දිවැසිවරුන්ගේ විශ්වාසය වර්ධනය වන යුගයක ය.

(iii) අපෝස්තුළුවරුන්ට දරුණු පීඩන එල්ල වන යුගයක ය.

(iv) විශ්වාසයේ අත්දැකීම ජනතාවට සමීප කරවන යුගයක ය.

10 ඩොමීෂියන් අධිරාජ්‍යයාගේ සමයේදී කිතුණුවන් පීඩාවට ලක් වූ ප්‍රධානම හේතුව වන්නේ,

(i) ක්‍රිස්තුස් වහන්සේ අනුගාමීවීමයි.

(ii) රෝම අධිරාජ්‍යයා දේවත්වයෙහිලා වැඳුම්, පිදුම් නොකිරීමයි.

(iii) රෝම අධිරාජ්‍යයා අයබදු නොගෙවීමයි.

(iv) සීසර් අධිරාජ්‍යයාගේ කාසි භාවිතයට නොගැනීමයි.

11 උපදේශකයා හෙවත් සිරාක් ග්‍රන්ථයෙන් අපට උගන්වන්නේ,

(i) රාජ්‍ය පාලනය හා ප්‍රභූ පන්තිය සඳහා මඟ පෙන්වීම යි.

(ii) ජීවිත හරය, එහි ගැටළු, විනිශ්චය පිළිබඳව අවධාරණය කිරීම යි.

(iii) පවුල හා ගෝත්‍රය සංරක්ෂණය වීම සඳහා මඟපෙන්වීම යි.

(iv) දෛනික අභියෝග හමුවේ නොසැලී සිටීමට, උපදෙස් දීම යි.

12 ඔබ ක්‍රිස්තුස්ද?, ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජේසුස් වහන්සේගෙන් ඇසූ පැනයට දුන් පිළිතුරු වූයේ,

(i) "ඔබ රාජශ්‍රීයෙන් වඩනා කළ ඔබ සිහි කළ මැනව" යන්න යි.

(ii) "පියාණනී ඔවුන්ට කමා කළ මැනව" ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති යි යන්නයි.

(iii) "පියාණනී ඔබගේ හස්තයට මාගේ ආත්මය බාර කරමි"යන්න යි.

(iv) "මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේ බලපරාක්‍රමයෙන් දකුණු පස වැඩ හිඳිනු ඇත"යන්න යි.

13 ආදම් ඒවගේ පාපයෙන් පසු, දෙවියන් වහන්සේ විසින් පොරොන්දු වන ලද "ගැලවීම" මානව සංහතියට හිමි වූ වූයේ,

(i) ජේසුස් වහන්සේ උකුත් වී දින තුනකට පසු මළවුන්ගෙන් නැගිටීමෙනි.

(ii) එම්මාවුස් ගමනේදී ගෝලයන් දෙදෙනෙකුට දර්ශනය වීමෙනි.

(iii) පාස්කු ඉරුදින අපෝස්තුළුවරු වෙත වැඩම කිරීමෙනි.

(iv) හිමිදිරි උදෑසන මග්දලාහි මරියාට දර්ශනය වීමෙනි.

14 එළිදරව් ග්‍රන්ථයේ නව අහස හා නව පොළොව ලෙස හඳුන්වා දී ඇත්තේ,

(i) ශුද්ධවූ සභාවයි. (ii) ස්වර්ගීය ජීවිතයයි.

(iii) ශුද්ධාත්ම ආගමනයයි. (iv) ලෝකය මැවීමයි.

15 විවිධ ප්‍රදේශවල සිටි ජුදෙව්වරු සෑම වර්ෂයකම ජෙරුසලම් දේව මාලිගාවට රැස්වූයේ,

(i) සංගණනය සඳහා ය. (ii) බිළිඳුන්ගේ මංගල්‍යය සඳහා ය.

(iii) පෙන්තකොස්ත මංගල්‍යය සැමරීමට ය. (iv) සබත් දින වත් පිළිවෙත් ඉටු කිරීමට ය.

16 මුල් කිතුනු සභාවේ ලක්ෂණ ඇතුළත් වනුයේ,

(i) උපදේශකයා හෙවත් සිරාක් ග්‍රන්ථයෙහි ය. (ii) සුවිශේෂක ජොහාන් ග්‍රන්ථයෙහි ය.

(iii) ශුද්ධවූ පාවුළුතුමාගේ පිලිප්පි ලිපියෙහි ය. (iv) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි ය.

17 සන්තියාගෝ මුනිතුමා ලෙස හඳුන්වනු ලබන අපෝස්තුළුවරයා වනුයේ,

(i) ශුද්ධවූ අතනාසියුස්තුමා ය. (ii) ශුද්ධවූ සෙබස්තියන් මුනිතුමා ය.

(iii) ශුද්ධවූ අන්තෝනි මුනිතුමා ය. (iv) ශුද්ධවූ මහා ජාකොබ්තුමා ය.

18 ශුද්ධවූ පාවුළුතුමාගේ ජීවිත වෙනසකට ඔහුව යොමුකළ සිද්ධිය වූයේ,

(i) ධර්මදූත චාරිකාවලදී ලැබූ අත්දැකීම් ය.

(ii) ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවකයෙකුවීම ය.

(iii) උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ ඔහුට හමුවීම ය.

(iv) ශුද්ධාත්ම මගපෙන්වීම මත සිරගෙයින් නිදහස්වීම ය.

19 ශුද්ධවූ පාවුළුතුමා තාර්සස් නුවර ධර්මය දේශනා කිරීම සිදු කළේ,

(i) පළමු ධර්මදූත චාරිකාවේදී ය. (ii) දෙවන ධර්මදූත චාරිකාවේදී ය.

(iii) තෙවන ධර්මදූත චාරිකාවේදී ය. (iv) සියළුම ධර්මදූත චාරිකාවලදී ය.

20 ශුද්ධවූ පාවුළු තුමා තම තෙවන ධර්මදූත චාරිකාවසඳහා තෝරා ගත් නගර තුනකි.

(i) සිලුකිය, සලමිසය, පාපස් (ii) ජෙරුසලම, පිලිප්පිය, තෙසලෝනිය

(iii) දර්බය, ලුස්ත්‍රාව, ඉකෝනිය (iv) ඉකෝනිය, ත්‍රෝවසය, ග්‍රීසිය

21 'ඔබ ඉතා භාග්‍යවන්තය' යි ජේසුස් වහන්සේ විසින් පවසන ලද්දේ,

(i) සකේවුස්ට ය. (ii) දකුණු පස සොරාට ය.

(iii) පාවුලු තුමාට ය. (iv) පේදුරුතුමාට ය.

22 'මේ පර්වතය පිට මගේ සභාව ගොඩනගන්නෙමි. මරණයේ බලයට වුවද එය පරාජය කළ නොහැකිය.' මෙම ප්‍රකාශයට අදාළ පුද්ගලයා වූයේ,

(i) ශුද්ධවූ පේදුරුතුමා ය. (ii) ශුද්ධවූ පාවුළුතුමා ය.

(iii) ශුද්ධවූ ජොහාන්තුමා ය. (iv) ශුද්ධවූ ජාකොබ්තුමා ය.

23 අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ව කාදිනල් ධූරයට ඔසවන ලද්දේ,

(i) 6 වන පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් ය.

(ii) 2 වන ජුවාම් පාවුළු මුනිතුමන් විසින් ය.

(iii) 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් විසින් ය.

(iv) 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමන් විසින් ය.

24 ශුද්ධවූ සභාවේ එකමුතුකමේ පදනම වූයේ,

(i) ක්‍රිස්තුස් වහන්සේ ය. (ii) දේව ප්‍රේමය ය.

(iii) ශුද්ධවූ ත්‍රිත්වය ය. (iv) දේව වචනය ය.

25 "ශරීරය හිසින් හෝ අවයව ශරීරයෙන් ඉවත් වුවහොත් ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය විකෘති වේ. අංග විකල වේ." මෙලෙස සඳහන් වන්නේ,

(i) රෝම ලිපියේ ය. (ii) පිලිමොන් ලිපියේ ය.

(iii) 1 තෙසලෝනික ලිපියේ ය. (iv) 1 කොරෙන්ති ලිපියේ ය.

26 'මොවුන්ගේ වචනය කරණකොටගෙන මා අදහා ගන්නා අය' යනුවෙන් ජේසුස් වහන්සේ යාච්ඤා කළේ,

(i) අනාගත සභාව උදෙසා ය. (ii) මුල් කිතුනු සභාව උදෙසා ය.

(iii) තෝරාගත් ශ්‍රාවකයින් උදෙසා ය. (iv) අනුගාමී වූ උපස්ථායකයින් උදෙසා ය.

27 ශුද්ධවූ සභාවේ විශ්වීය බව දැක්වෙන්නේ,

(i) ඒකත්වය තුළිනි. (ii) කතෝලිකත්වය තුළිනි.

(iii) ශුද්ධත්වය තුළිනි. (iv) අපෝස්තලිකත්වය තුළිනි.

28 ශුද්ධවූ සභාව විශ්වීය බව ව්‍යාප්ත කරන්නේ,

(i) ප්‍රසාද නිධාන දානය කරමින්ය. (ii) දේව ප්‍රේමය ඵල දරමින්ය.

(iii) ධර්මදානයේ යෙදමින්ය. (iv) සමාව දීම පදනම් කරගෙනය.

29 මෙරට කතෝලික සභාව පිහිටු වීමට විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබුවේ,

(i) ලන්දේසි සමයේ පැමිණි ධර්මදූත පිරිස් ය. (ii) බ්‍රිතාන්‍ය යුගයේ පැමිණි ධර්මදූත පිරිස් ය.

(iii) නිදහස් යුගයේ පැමිණි ධර්මදූත පිරිස් ය. (iv) පෘතුගීසි සමයේ පැමිණි ධර්මදූත පිරිස් ය.

30 මෙරටට පැමිණි ධර්මදූත කණ්ඩායම් ඉටු කළ දයා සේවාවන් අතරින් විශේෂ ස්ථානයක් හිමි වූයේ,

(i) අධ්‍යාපනය සඳහා ය. (ii) සෞඛ්‍යය සේවය සඳහා ය.

(iii) අනාථ ළමා නිවාස සඳහා ය. (iv) වැඩිහිටි නිවාස සඳහා ය.

31 ක්‍රි.ව. 1658 - 1796 කාලය තුළ රෙපරමාදු නිකාය තම රාජ්‍ය ආගම බවට පත් කර ගත් රට කුමක්ද?

(i) පෘතුගීසිය. (ii) ඕලන්දය. (iii) බ්‍රිතාන්‍යය. (iv) ස්පාඤ්ඤය.

32 ෆ්‍රැන්සිස්කාන කන්‍යා සොයුරියන්ගේ පැවිදි නිකාය මෙරට ධර්මදූත සේවයට පැමිණියේ,

(i) පෘතුගීසි යුගයේ දී ය. (ii) ලන්දේසි යුගයේ දී ය.

(iii) බ්‍රිතාන්‍ය යුගයේ දී ය. (iv) නිදහසින් පසු යුගයේදී ය.

33 හලාවත පදවියේ සේවය කොට ස්වර්ගස්ථ වූ රදගුරුතුමෙකි.

(i) අති උතුම් ලියෝ නානායක්කාර හිමිපාණෝ ය.

(ii) අති උතුම් දොන් සිල්වෙස්ටර් හිමිපාණෝ ය.

(iii) අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ ය.

(iv) අති උතුම් ෆ්‍රෑන්ක් මාකස් හිමිපාණෝ ය.

34 පරිස්මරණයක් යනු,

(i) ප්‍රේමය එළදැරීමකි. (ii) බලාපොරොත්තු වීමකි.

(iii) අත්දැකීමට ඇතුළුවීමකි. (iv) පංගුකාරවීමකි.

35 'සලොම්' යනුවෙන් හැඳින්වූයේ,

(i) බෙත්ලෙහෙම් නුවරය. (ii) ජෙරුසලම් නුවරය.

(iii) නාසෙරෙත් නුවරය. (iv) නායිම් නුවරය.

36 ඉරුදින දිව්‍ය යාගය යනු,

(i) ප්‍රේමයේ හා සේවයේ අනුස්මරණයකි. (ii) දිව්‍ය සත්ප්‍රසාදය ජීවමාන කරවීමකි.

(iii) දේව පණත් ඉටු කිරීමකි. (iv) ණය යුක්තිය ක්‍රියාත්මක කිරීමකි.

37 ක්‍රිස්තුන් වහන්සේ තුළ කල්වාරි යාගයට සම්බන්ධවිය හැක්කේ,

(i) දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට පෙර ශාරීරිකව සූදානම් වීමෙනි.

(ii) පාපයට මැරී නව ජීවිතයකට, උත්ථානවීමෙනි.

(iii) පඬුරු පූජාසනය මත තබා සමාව ලබා ගැනීමෙනි.

(iv) සමගි සන්ධානයේ ප්‍රසාද නිධානය ලබා ගැනීමෙනි.

38 ජුදා යාග පිළිවෙත් පූර්ණත්වයට පත් වූයේ,

(i) සීනායි ගිවිසුම මගිනි. (ii) පාප පූජා මගිනි.

(iii) කල්වාරි යාගය මගිනි. (iv) සකරියස්තුමාගේ යාගය මගිනි.

39 ශුද්ධවූ තෙරේසා මව්තුමිය උපත ලැබුවේ,

(i) කල්කටාවේදී ය. (ii) සැන්කොල්හිදි ය.

(iii) ගෝවේ නගරයේ දී ය. (iv) ඇල්බිනියාවේ ය.

40 මතෙව් සුබ ආරංචියට අනුව ජාතීන්ගේ විනිශ්චය දිනයේ ක්‍රිස්තුන් වහන්සේ යොදා ගන්නා මිනුම් දණ්ඩ වන්නේ,

(i) ශාරීරික පුණ්‍ය ක්‍රියා ය. (ii) පූර්ණ ඵලය

(iii) ශුද්ධාත්ම දීමනාය ය. (iv) මුල් අගුණ පව් ය.

*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **කතෝලික ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) ශුද්ධ වූ පාවුළුතුමාගේ ආරූඪ කතෘත්වය හිමි ලිපි දෙකක් නම් කරන්න.

(ii) ජේසුස් වහන්සේ කුරුස ගසේ දී ප්‍රකාශ කළ ශ්‍රී වාක්‍ය දෙකක් ලියන්න.

(iii) උපස්ථායකයින් පත් කිරීමේදී සලකා බැලූ ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(iv) පාවුළුතුමා සංදේශ ලියා යැවීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.

(v) ජේසුස් වහන්සේ පේදුරුතුමාට හිමිකර දුන් බලතල දෙකක් ලියන්න.

(vi) ශුද්ධ වූ සභාවේ දෘශ්‍යමාන නායකයා හැඳින්විය හැකි නම් දෙකක් සඳහන් කරන්න.

(vii) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට සේවය සඳහා පැමිණි ධර්මදූත කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(viii) දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට නික්මයාම ගමනට පෙර දුන් උපදෙස් දෙකක් සඳහන් කරන්න.

(ix) 'බලාපොරොත්තුවේ එළපත්ත' 'වීර සෙබළා' යන ග්‍රන්ථ රචනා කළ තැනැත්තන් නම් කරන්න.

(x) කතෝලික සභා ධර්මෝපදේශයට අනුව යාච්ඤා කළ හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.

(ලකුණු $2 \times 10 = 20$)

02 ((i) නව ගිවිසුමේ පොත් කාණ්ඩ දෙකක් නම් කරන්න.

(ii) අපෝස්තුළුවරුන් විසින් ලියූ නව ගිවිසුමේ වෙනත් ලිපි ලියූ පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න.

(iii) ශුද්ධවූ සභාවේ වර්ධනය උදෙසා කිතුනු ඔබ, ලේඛන හැකියාව යොදා ගන්නා ආකාරය කරුණු පහක් ඇසුරින් සඳහන් කරන්න. (ලකුණු $2+3+5=10$)

03 (i) ක්‍රිස්තුන් වහන්සේ උකුත් වූ අවස්ථාවේ පරිසරයේ සිදු වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(ii) ජේසුස් වහන්සේ ශ්‍රාවකයින්ට දර්ශනය වූ අවස්ථා තුනක් ලියන්න.

(iii) උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ අත්දැකිමින් සදාතන ජීවිතය උරුම කර ගැනීමට ඔබ ක්‍රියා කරන ආකාර පහක් ලියා දක්වන්න. (ලකුණු $2+3+5=10$)

04 (i) වත්මන් ශුද්ධෝත්තම පියතුමාගේ බව්තිස්ම නාමය හා ශුද්ධවරයට එසවීමෙන් පසු නාමය ලියා දක්වන්න.

(ii) තෙවන ධර්මදූත චාරිකාවෙන් පසු ශුද්ධවූ පාවුළුතුමා මුහුණ දුන් අභියෝග තුනක් සඳහන් කරන්න.

(iii) ඔබ පාසලේ ශිෂ්‍ය නායක හෝ පන්ති නායක තනතුර, සැබෑ එඬේරෙකු ලෙස ඉටු කරන ආකාරය කරුණු පහක් ඇසුරින් ඉදිරිපත් කරන්න. (ලකුණු $2+3+5=10$)

05 (i) අපෝස්තලිකත්වය යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි ලියා දක්වන්න.

(ii) යමක් හෝ යමෙක් දෙවියන් වහන්සේට ඇති සම්බන්ධතාවය මත ශුද්ධවන්තවේ. උදාහරණ තුනක් සඳහන් කරන්න.

(iii) පොදු පූජකවරය තුළින් ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීමට කැඳවීම ලැබූ ඔබ මීසම තුළ ක්‍රියාකාරී වන ආකාර පහක් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

06 (i) ශු. ජුසේවාස් මුනිතුමාගේ මා පියන් නම් කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ රදගුරු පදවි තුනක් නම් කරන්න.

(iii) සැබෑ කිතුනු අනුගාමිකයෙකු ලෙස ඔබේ පන්ති කාමරය තුළ ක්‍රිස්තුන් වහන්සේව ජීවමාන කරවන ආකාර පහක් ලියන්න. (ලකුණු $2+3+5=10$)

07 පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) පුරාණ ගිවිසුමේ පාස්කු භෝජනය

(ii) නව ගිවිසුමේ පාස්කු භෝජනය

(iii) තෙරේසා මව් තුමිය

(iv) ගෞරවනීය ගොන්සල්වෙස් පියතුමා (ලකුණු $5+5=10$)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 2 ) | 03. ( 3 ) | 04. ( 4 ) | 05. ( 4 ) | 06. ( 4 ) | 07. ( 3 ) | 08. ( 3 ) | 09. ( 1 ) | 10. ( 2 ) |
| 11. ( 3 ) | 12. ( 4 ) | 13. ( 1 ) | 14. ( 2 ) | 15. ( 3 ) | 16. ( 4 ) | 17. ( 4 ) | 18. ( 3 ) | 19. ( 2 ) | 20. ( 3 ) |
| 21. ( 4 ) | 22. ( 1 ) | 23. ( 2 ) | 24. ( 3 ) | 25. ( 1 ) | 26. ( 1 ) | 27. ( 2 ) | 28. ( 3 ) | 29. ( 4 ) | 30. ( 1 ) |
| 31. ( 2 ) | 32. ( 3 ) | 33. ( 4 ) | 34. ( 3 ) | 35. ( 2 ) | 36. ( 1 ) | 37. ( 2 ) | 38. ( 3 ) | 39. ( 4 ) | 40. ( 1 ) |

(ල. 40)

## II පත්‍රය

(01) (i) 2 තෙසලෝනික, 1 තිමති, 2 තිමති, තීතස් (පිටුව 08)

(ii)
- පියාණනි ඔවුන්ට කමා කළ මැනව. ඔවුන් කරන දෙය ඔවුන් නොදනිති'යි වදාළ සේක.
- පියාණනි ඔබගේ හස්තයට මගේ ආත්මය භාර දෙමි'යි (පිටුව 20/21)

(iii)
- යහපත් දිවි පෙවතක් ගත කිරීම.
- ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම.
- ප්‍රඥාවෙන් පූර්ණ වීම.

(පිටුව 24)

(iv)
- පාවුළුතුමා ස්ථාපිත කළ සභාවන්හි ගැටළු නිරාකරණය කිරීම.
- කිතුණු ඇදහිල්ල හා යුතුකම් පෙන්වා දීම.
- ක්‍රිස්තුස් වහන්සේ තුළ නව ජීවනය පවත්වා ගැනීම.
- ක්‍රිස්තුස් වහන්සේගේ පුනරාගමනය පිළිබඳ ගැටළුවලට පිළිතුරු දීම (පිටුව 29)

(v) පව් කමා කිරීමේ බලය / විශ්වාසය හා සදාචාරය පිළිබඳ ඉගැන්වීමේ බලය (පිටුව 31)

(vi) ශුද්ධෝත්තම පියතුමා / පාප්වහන්සේ / සුදතුම් පියා (පිටුව 32)

(vii)
- සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය
- නිමල මරිය නිකාය
- ජේසු නිකාය
- ද ලාසාල් සොහොයුරන්සේ පැවදි නිකාය
- මාරිස්ට් සොහොයුරන්සේ පැවිදි නිකාය
- ශු. පවුලේ කන්‍යා සොයුරියන් (පිටු 41)

(viii)
- බැටළුවෙකු මරා උගේ ලේ තම නිවෙස්වල දොරෙහි උළුවස්සෙහි කණුවල තැවරීම.
- උගේ මස් නුමුහුන් රොටී හා තිත්ත පලා සමඟ එම රාත්‍රියේදීම ඉතිරි නොවන ලෙස අනුභව කිරීම. (පිටු 50)

(ix) බලාපොරොත්තුවේ එළිපත්ත - දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
වීර සෙබළා - මැක්ෂිමියන් කෝල්බේ මුනිතුමා (පිටුව 61)

(x) වන්දනාව, ප්‍රශංසාව, ස්තුතිය, මැදිහත්වීම, ඉල්ලීම (පිටු 66) (ලකුණු 2 x 10 = 20)

(02) (i) ශුභාරංචි හා අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත, හසුන්, එළිදරව් සාහිත්‍යය (පිටු 04)

(ii) ජාකොබ්, පේදුරු, ජොහාන්, ජුද් (පිටු 04)

(iii)
- පුවත්පත් සඳහා ලිපි නිර්මාණය කර එමගින් පණිවිඩ ඉදිරිපත් කිරීම.
- ශුද්ධවූ සභාවේ වර්ධනය උදෙසා යාච්ඤා නිර්මාණය කිරීම.
- ගීතිකා නිර්මාණය කර බෙදා හැරීම.
- ග්‍රන්ථ රචනා කිරීමට දායකවීම.
- විභාගයේදී නිර්මාණාත්මක පිළිතුරු ලිවීම ආදී පිළිතුරු ඇත්නම් ලකුණු පිරිනමන්න.

(03) (i) හිරු අඳුරු විය, රට පුරා අන්ධකාරයක් පහළ විය. දේවමාලිගා තිරය දෙකඩ වී ඉරී යාම (21 පිටුව)

(ii)
- ගෝලයින් දෙදෙනෙක් එම්මාවුස් ගමට යමින් සිටියදී
- පාස්කු ඉරුදින සවස
- තෝමස් අපෝස්තුළුවරයාට (පිටු 21,22)

(iii)
- දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමට කටයුතු කිරීම.
- දසපනතට අනුව දිවි ගෙවීම.
- තම වගකීම හැකි උපරිම අයුරින් ඉටු කිරීම.
- ජනවන්දනාවට අර්ථවත්ව සහභාගී වීම.
- පරාර්ථකාමී දිවි පෙවතක් ගත කිරීම වැනි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(04) (i) බෞතිස්ම නාමය - ජෝර්ජ් මාරිගෝ බර්ගෝලියන්
ශුද්ධවරයට එසවූ නාමය - අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියනම (පිටු 32)

(ii)
- දේව මාළිගාවේදී අත්අඩංගුවට ගැනීම.
- ජේසුතුමා මෙන් කිහිප දෙනෙකුගේ විනිශ්චයට ලක්වීම.
- සිරකරුවකු ලෙස රෝමයට ගෙන යාම (පිටු 29)

(iii)
- සියළු දෙනාට සහෝදරත්වයෙන් සැලකීම.
- පැවරෙන වගකීම නිසිලෙස ඉටු කිරීම.
- අන් අයට සවන්දීම.
- ගැටුම් සහිත අවස්ථාවලදී ක්‍රිස්තු ආදර්ශයට අනුව ඒවා නිරාකරණය කිරීමට වෙහෙසීම.
- ජීවිත ආදර්ශයෙන් යුතුව, නායකත්ව ගතිලක්ෂණ ඔප් නැංවීම.

මෙවැනි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

(05) (i)
- අපෝස්තුළුවරුන් හා වත්මන් ශුද්ධ වූ සභාව අතර වන දූත කාර්යයේ අනන්‍යතාවයි. (පිටු 36)

(ii) ශුද්ධවූ දේශය / ශුද්ධවූ ලේන්සු / ශුද්ධවූ පින්තූර / ශුද්ධවූ සභාව (පිටු 35)

(iii)
- අපගේ පව්වලට දුක්මනස්ථාපවීම හා සමාව ලබා ගැනීම.
- අයහපත් ක්‍රියා තුළින් ඉවත්වීමට කටයුතු කිරීම.
- අසත්‍ය දර්ශන හා වැරදි ආදර්ශ බැහැර කරමින් යහපත් මාර්ගයේ ගමන් කිරීම.
- ශාරීරික පිරිසිදුකම රැක ගැනීම.
- දේව ගරුබිය තුළ දිවි ගෙවීමට කටයුතු කිරීම.

(06) (i) මව - ක්‍රිස්ටෝපර්වාස්      පියා - මරිය මිරැන්ඩා (පිටු 40)

(ii) කොළඹ, ගාල්ල, හලාවත, කුරුණෑගල, යාපනය, මහනුවර (පිටු 43)

(iii)
- පාසල ආරම්භ කිරීමට පෙර පන්තියට පැමිණීම.
- පන්තිකාමරය පිරිසිදු කිරීම දෛනිකව සිදු කිරීම.
- පසුගාමී සිසුන්ට අධ්‍යාපන කටයුතුවලදී සහයවීම.
- ගුරුවරයෙකු නොමැති අවස්ථාවල විනයානුකූල හැසිරීම.
- සැමදෙනා සමඟ සහයෝගයෙන් බෙදා ගැනීමෙන් කටයුතු කිරීම

යනාදි කරුණු පිළිබඳව ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

(07) (i) පිටු 49/50

(ii) පිටු 51/52

(iii) පිටු 59

(iv) පිටු 41